**ජාතික යොවුන් සේනාංකය - 2015**
**-------------------------------------**

ජාතික යොවුන් සේනාංකයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සේනාංකයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සේනාංකයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **ආයතනය පිහිටුවීම හා එහි ක්‍රියාකාරීත්වය**

------------------------------------------------

යොවුන් සේනාංකය 2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනත මගින් ස්ථාපිත කර තිබුණි. 2002 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සියළු වියදම් එවකට රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ ගිණුම්ගත කොට තිබුණි. පනතට අනුව යොවුන් සේනාංකය යනු කුමන වර්ගයට අයත් ආයතනයක් ද යන්න නිශ්චිතව සඳහන් නොවීම හා වෙනත් ගැටළු පිළිබඳව 2011 ජනවාරි 18 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් යෝජිත පරිදි සේනාංක පනත සංශෝධනය කිරීමට හා සේනාංකය නෛතික පුද්ගලභාවයක් ඇති ආයතනයක් ලෙස සළකමින් පරිපාලන හා මූල්‍යමය බලතල සේනාංකයේ අධ්‍යක්ෂකවරයාට පැවරීම සඳහා 2011 පෙබරවාරි 10 දින අනුමැතිය ලබා ඇතත් ඒ අනුව පනත සංශෝධනය වී නොතිබුණි. එසේ තිබියදී ජාතික යොවුන් සේනාංකයේ පළමු ගිණුම් කට්ටලය ලෙස 2015 වර්ෂය සඳහා වූ අවසන් මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුනු අතර අදාල පනතේ 17 වගන්තිය පරිදි සේනාංකයේ ගිණුම් විගණනය විගණකාධිපති වෙත පැවරී ඇත. තවද, සේනාංකය විසින් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් සඳහා ආරම්භක ශේෂයන් ලබාගැනීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂ අවසානය දක්වා කාලපරිච්ඡේදය අදාල කරගෙන තිබුණි.

1.5 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

2.1 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------------

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

--------------------------------------------

(අ) ප්‍රමිතයේ 43 වගන්තිය ප්‍රකාරව පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු විසින් අදාළ වත්කම් තක්සේරු කළයුතු වුවත් 2015 වර්ෂයේ සේනාංකයට අදාළව වත්කම් ගිණුම්ගත කිරීමේදී සේනාංකයේ සේවය කරන කාර්ය මණ්ඩලය මගින් අදාල වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ආ) ප්‍රමිතයේ 69 වගන්තිය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සුදුසු තත්ත්වයට ගෙන ආ පසුව වුවද සේනාංකය වත්කම් ක්ෂය කිරීම සඳහා ඊට පටහැනි ප්‍රතිපත්තියක් තෝරාගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෝටර් රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු.712,054 ක පුනරාවර්තන වියදම් සහ ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් ලෙස සැලකිය නොහැකි වූ රු.1,139,962 ක වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ පෞරුෂාභිමානී වැඩසටහනට අදාළ රු. 662,500 ක්, අත්තිකාරම් ගෙවීම් රු.350,786 ක් හා ස්ථාවර වත්කම් හා තොග මිලදී ගැනීම් රු.837,753 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වෙනත් ආයතනික වියදම් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ඌනතාවය රු. 1,851,039කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ පෞරුෂාභිමානී වැඩසටහන් හා කලා උළෙල වෙනුවෙන් දරන ලද එකතුව රු.6,337,732 ක් ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් වියදම් ලෙස දක්වා තිබුණි.

(ඈ) 2014 ජුනි 21 දින ප්‍රදානයක් වශයෙන් ලැබුණු රු.11,468,480 ක් වටිනා IBPO Training Kit තොගයක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විනාශ කරන ලද වටිනාකම රු.432,255 ක්වූ විසිරයාමේදී භාවිතා කරන නිල ඇඳුම් සහ වටිනාකම රු.740,800 ක්වූ ජර්නි මෙට්ට්‍රස් තොගයක් පිළිවෙලින් වාර්ෂික නිල ඇඳුම් වියදමේ හා ලීබඩු හා කාර්යාල උපකරණ නඩත්තු වියදම් තුළ අන්තර්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත 2(4) වගන්තිය | යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තිය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්යයන් සඳහා කමිටු තුනක් පත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: මුදල් රෙගුලාසි 571(3) | අදාළ විස්තර ලැබෙන තෙක් තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි, අදාළ ගිණුමට හෝ ආදායමට බැර කිරීමට නැතහොත් හැකි ඉක්මණින් ආපසු ගෙවීමට කටයුතුකළ යුතු නමුත් එසේ කටයුතු නොකර 2013 වර්ෂයට අදාළ එකතුව රු.159,334 ක් වූ රැඳවුම් මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේනාංකයේ භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු. 512,793,466 ක් ඇතුළත්ව මුළු ආදායම රු. 553,015,706 ක් වූ අතර මුළු වියදම රු. 563,585,367 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 10,569,661 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---

ජංගම අනුපාතය 5.63:1 මට්ටමක පැවතියද, ක්ෂණික අනුපාතය 0.66:1 ක් වී තිබුණි. ජංගම වත්කම් තුළ තොගය සියයට 88 ක් නියෝජනය වීම මේ සඳහා හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1. කාර්යසාධනය

---

2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 3 වගන්තිය අනුව සේනාංකයේ අරමුණු වන්නේ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීය සංවර්ධනයයි. එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ ජූලි මාසවලදී පළමු හා දෙවන කණ්ඩායම ලෙස මධ්‍යස්ථාන 35 ක් සඳහා බඳවාගත් සිසුන් 7,697 ක් අතරින් සිසුන් 4,936 ක් පාඨමාලාව සාර්ථක ලෙස නිමකර තිබුණ ද, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සඳහා වූ නිපුණතා පරීක්ෂණයට ඉදිරිපත්ව තිබුනේ සිසුන් 4,629 ක් පමණි. මෙයින් විභාගය සමත්ව තිබුනේ සිසුන් 4,385 ක් පමණි, මේ අතරින් සිසුන් 1,842 ක් සඳහා, සහතිකපත් ලැබී නොතිබුණු අතර සහතික පත් නිකුත් කරනු ලබන බාහිර ආයතනයේ ප්‍රමාදය මේ සඳහා හේතු වී තිබුණි.

(ආ) බඳවාගත් සිසුන් අතරින් සිසුන් 2,471 ක් පාඨමාලාව හැරගොස් තිබුණි.

(ඇ) පාඨමාලාව හැරනොගිය නමුත් පාඨමාලාව සම්පූර්ණ නොකළ සිසුන් ගණන 290 ක් වූ අතර පාඨමාලාව නිමකළ නමුත් ඇගයීම් පරීක්ෂණයට ඉදිරිපත් වී නොතිබුණු සිසුන් සංඛ්‍යාව 307 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී බාහිර වෘත්තීය පුහුණු ආයතනයක් වෙත රු.23,980,610 ක ගෙවීමක් කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 3/4) ලබාගැනීම සඳහා සිසුන් 2,796 ක් යොමුකර තිබුණ ද, එම පුහුණුව සාර්ථකව නිමකර තිබුණේ සිසුන් 1,710 පමණි. මෙම ප්‍රමාණය සේනාංකය වෙත බඳවාගත් සිසුන්ගෙන් සියයට 22 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 67 වන නිදහස් දින පෙළපාලිය සඳහා සහභාගී වීම වෙනුවෙන් රු. 6,403,951 ක වියදමක් 2015 වර්ෂය තුළදී යොවුන් සේනාංකය විසින් දරා තිබුණු අතර මෙම වියදම ආයතනයේ අරමුණුවලට අනුගත නොවන වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, හෝටල් පාඨමාලා ගාස්තු ලෙස රු. 810,812 ක් අයකර තිබුණ ද, මෙලෙස පාඨමාලා සඳහා ගාස්තු අය කිරීමට සභාවෙන් අනුමැතියක් ලබා ගත් බවට හෝ පාඨමාලා ගාස්තු තීරණය කිරීමට අදාලව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) යොවුන් සේනාංකයට පරිබාහිර කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙනුවෙන් දරන ලද වියදමක්වූ රු. 1,886,281 ක් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සේනාංකයේ වියදම් ලෙස දක්වා තිබුණි.

**4.3 ආර්ථික නොවූ ගණුදෙනු**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(4) (ඉ) උප වගන්තිය අනුව පාරිතෝෂිකය ගෙවීම නියමිත දිනයේ සිට මාස 12 කට වැඩි කාලයක් සඳහා හිඟ හිටුවා ඇති අවස්ථාවක පාරිතෝෂිකය වශයෙන් අයවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක් ගෙවිය යුතුවේ. සේනාංකයේ අකාර්යක්ෂමතාව හේතුවෙන් සේවකයින් 10 දෙනෙකු සඳහා මෙලෙස සියයට 30 ක අධිභාරයක් වූ රු. 206,459 ක් ගෙවීමට සිදුවී තිබුණි. තවද, මෙම අධිභාර මුදල පාරිතෝෂික ගිණුමට හර කර තිබූ බවද නිරීක්ෂණය විය.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අයිතිය තහවුරු කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් නොකළ නමුත් සේනාංකය විසින් මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ ලෙස ඇතුළත් කර ඇති තක්සේරු වටිනාකම රු. 2,000,000 ක් වූ මෝටර් රථ 02 ක් සමාලෝචිත වර්ෂය පුරාම භාවිතා කර නොතිබුණ අතර විගණිත දිනය වන 2017 මැයි 30 දින වන විටත් ඉන් එක් මෝටර් රථයක් ආයතන භූමියේ අනාරක්ෂිතව දිරාපත් වෙමින් පවතින බවද, අනෙක් මෝටර් රථය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනයේ රඳවා තබා ඇති බවද නිරීක්ෂණය විය.

**4.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සර්වෝදයට අයත් ඉඩමක රු. 4,630,000 ක වියදම් දරා ඉදිකරන ලද ගොඩනැගිල්ලක තිබූ තණමල්විල යොවුන් සේනාංක මධ්‍යස්ථානය 2013 ජූලි 15 දින වසා දමා තිබුණි. ගොඩනැගිලි භාවිතයේදී සිදු වූ අලාභයන් වන රු.1,049,223 ක් හා ක්ෂය අඩු කළ පසු ශුද්ධ ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු. 1,449,047 ක් අදාළ ගිවිසුම පරිදි දින තිහක් ඇතුළතදී අයකර ගත යුතු වූවත්, 2015 වර්ෂයේ අවස්ථා 3 කදී අයකර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව හඳුනාගෙන ඇති ජාතික යොවුන් සේනාංකයට භාවිතා කරනු ලබන ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකාරීත්වය සේනාංකයට නොමැති බව නිරීක්ෂණය විය. එලෙස නෛතික අයිතියක් නොතිබියදී ප්‍රධාන කාර්යාලය හා මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන වෙනත් ගොඩනැගිලි සහිත ඉඩම්වල ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 30,058,546 ක වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 676 ක් වූ අතර එය 319 ක ස්ථිර කාර්ය මණ්ඩලයකින් හා 357 ක කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයකින් සමන්විත විය. ආයතනයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයෙන් 17 ක් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් 109 ක ප්‍රමාණයක් පුරප්පාඩුව පැවැති අතර එම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.7** **වාහන උපයෝජනය**

---

ආයතනයේ භාවිතා කරමින් තිබූ, වෙනත් ආයතනවලට අයත් වටිනාකම රු. 27,401,000 ක් වූ වාහන 8 ක් ආයතනයේ මෝටර් රථ ලෙස ගිණුම් ගත කර තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2017 මාර්තු 23 දිනදීය.

**5.2** **අයවැය ලේඛනමය පාලනය**

---

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තනය නොවන වත්කම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 64 සිට සියයට 92 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සේනාංකයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ප්‍රධාන ලෙජරය නඩත්තු කර නොතිබීම හා ගිණුම් සැසඳීම් ප්‍රමාණවත්ව සිදුකර නොතිබීම. |
| (ආ) | ඉන්වෙන්ට්‍රි පාලනය | ලේඛන පවත්වා ගැනීමේ දුර්වලතා පැවතීම හා ගිණුම්ගත නොකරන ලද තොග පැවතීම. |
| (ඇ) | අයවැය පාලනය | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් හා තත්‍ය වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ඈ) | තොරතුරු පද්ධති පවත්වාගැනීම | හඳුන්වා දී ඇති තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කරන ලද තොරතුරු පහසුවෙන් හා ඉක්මණින් ලබාගත නොහැකි වීම. |